www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යංශය අතුරුදහන් වූ සසප සාමාජිකයා පිළිබඳ පරීක්ෂණය මග හරී

## Sri Lankan defence ministry stalls on inquiry into missing SEP member

**අපගේ වාර්තාකරු විසිනි**
**2007 මාර්තු 28**

ශ්‍රී ලංකාවේ උතුරේ කයිට්ස් දූපතේ නිවැසියන් වන සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජික නඩරාජා විමලේස්වරන් සහ ඔහුගේ මිතුරු සිවනාදන් මදිවදනන් අතුරුදහන් වී අදට දින හතකි. ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඇතුලු ආන්ඩුවේ බලධාරින් වෙත සසප නිල වසයෙන් පැමිනිලි කොට ඇතත් ඔවුන් දෙදෙනා සොයා ගනු වස් කිසිදු පියවරක් ගෙන නැත.

මාර්තු 22 දා විමලේස්වරන් හා මදිවදනන් අතුරුදහන් වූයේ කයිට්ස් අසල පුංගුඩුතිව් දූපතේ මදතුවේලි ගම්මානයට ගොස් සිටිය දී ය. කයිට්ස්හි අම්පිහෙයිනගර් ගමේ පැවැත්වෙන විවාහ උත්සවයකට සහභාගි වීමට අවශ්‍ය ඇඳුම් කිහිපයක් ගෙන එනු පිනිස එම ගම්මානයේ තමා කුලියට ගත් නිවසකට විමලේස්වරන් ගොස් තිබුනි.

විමලේස්වරන් සිය මිතුරාගේ යතුරු පැදියේ පිටුපස නැගී කයිට්ස් හා පුංගුඩුතිව් යා කරන ගල් පාලමට ඇතුලු වූ බවට ඇසින් දුටු සාක්ෂ්‍ය පවතී. ඔවුන් දෙදෙනා මදතුවේලි ගම්මානයේ නිවසේ සිටි බව ද කයිට්ස් කරා පෙරලා යනු පිනිස එතැනින් පිටත්ව ගිය බව ද එගම සිටින ඔහුගේ ඥාතීන් හා අසල්වැසියන් දැක ඇත. දෙදෙනාගෙන් කිසිවකු හෝ යතුරු පැදිය හෝ ඉන් පසුව කවරෙකු වත් දැක නැත.

පුංගුඩුතිව් හා වේලෙනෙයි නාවික හමුදා කඳවුරුවල අන දෙන නිලධාරින් වෙත සසප වහාම පැමිනිලි ඉදිරිපත් කලේ ය. සෙනසුරාදා සසප ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් වෙත ෆැක්ස් මාර්ගයෙන් පැමිනිල්ලක් යොමු කලේ ය. යාපන අර්ධද්වීපයට ඔබ්බෙන් පිහිටි උතුරේ දූපත් සියල්ල ම පවතින්නේ, ඊලම් මහජන ප්‍රජාතන්ත්‍ර පක්ෂයේ (ඊපීඩීපී) පැරා-මිලිටරි කන්ඩායම් සමග සමීපව වැඩ කරන නාවික හමුදාවේ දැඩි ආරක්ෂාව යටතේ ය.

ආන්ඩුව හා මිලිටරිය දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි යුද්ධය උත්සන්න කිරීමත් සමග ම පසු ගිය වසර තිස්සේ සිය ගනනක් පැහැර ගැනීමට ලක්ව, ඝාතනය කෙරී හෝ" අතුරුදහන් " වී ඇත. මිලිටරියේ අනුග්‍රහය ලබන ඝාතක කල්ලි මේ සම්බන්ධයෙන් වගකිව යුතු යැයි පුලුල්ව විශ්වාස කෙරෙයි.

විමලේස්වරන් හා මදිවදනන් අතුරුදහන් වූයේ නාවික හමුදා මාර්ග බාධකයක් දෙසට ගමන් කිරීමෙන් පසුව ය යන කරුන මතු කරන්නේ මිලිටරිය මෙම සිද්ධියට සම්බන්ධ බව යි. පුංගුඩුතිව් හා වේලනෙයි නාවික හමුදා කඳවුරු භාර අන දෙන නිලධාරින් සිදු වූ දෙය පිලිබඳ ප්‍රමානවත් පැහැදිලි කිරීමක් සැපයීමට අපොහොසත්ව ඇත.

ඊයේ සසප විසින් එය අමතනු ලැබූ කල, ආරක්ෂක අමාත්‍යංශය විමලේස්වරන් හා මදිවදනන් අතුරුදහන් වීම සම්බන්ධයෙන් සොයා බැලීමට කිසිවක් කර තිබුනේ නැත. සසප ෆැක්ස් ලිපිය සෙනසුරාදා අමාත්‍යංශය වෙත ලැබුනු බව පොලීසියේ කටයුතු භාරව සිටින අතිරේක ආරක්ෂක ලේකම් එච්.කේ. බාලසූරිය පිලිගත්තා ය. එහෙත් ඇය කියා සිටියේ එය ඇයට ලැබුනේ සඳුදා බව යි. එවන් පැමිනිලි පොලිස්පති වෙත යොමු කෙරෙන බව ද ඇය පැවසුවා ය.

බාලසූරිය ෆැක්ස් ලිපිය සම්බන්ධයෙන් කිසිවක් කර තිබුනේ නැත. නමුත් තමන් එයට යෙදෙන බව ද ඇය කියා සිටියා ය. අතුරුදහන් වීම සිදුව ඇත්තේ කොලඹ දී දැයි විමසමින් ඇය පෙන්නුම් කලේ තමන් එම පැමිනිල්ල කියවා වත් නැති බව යි. අතුරුදහන් වූ දෙදෙනා ජීවත් වූයේ කයිට්ස් දූපතේ බව දැන්වූ කල බාලසූරිය පැවසුවේ තමන් උතුරු කලාපය භාර නියෝජ්‍ය පොලිස්පතිට දැනුම් දෙන බව හා තත්වය ගැන යමක් දැන ගත හැකි වනු ඇත්තේ සිකුරාදා වන විට බව යි.

ආරක්ෂක අමාත්‍යංශය මේ සම්බන්ධයෙන් දක්වා ඇති නිෂ්ක්‍රීයත්වය හා නොතැකීම මගින් අවධාරනය කෙරෙන්නේ අතුරුදහන් වී ඇති සිය ගනනක් මිනිසුන් පිලිබඳ එය දරන ආකල්පය යි. මෙම අතුරුදහන් වීම්වලින් එකදු සිද්ධියක් වත් විසඳනු ලැබ නැත. නාවික හමුදා නිලධාරියකු හෝ වෙනත් ආරක්ෂක හමුදා සාමාජිකයකු මීට සමාන කොන්දේසි යටතේ කයිට්ස්හි

දී ආගිය අතක් නැති වුව හොත් මෙවන් නිෂ්ක්‍රීයත්වයක් දක්නට නොලැබෙනු ඇත. වටලා කෙරෙන සෝදිසි මෙහෙයුම් දියත් කොට අහිංසක මිනිසුන් දුසිම් ගනනින් අත් අඩංගුවට ගනු පිනිස ආරක්ෂක හමුදාවෝ සිය මර්දන බලතල වහාම යොදා ගනු ඇත.

විමලේස්වරන්ගේ හා ඔහුගේ මිතුරාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ආන්ඩුව හා මිලිටරිය වගකිව යුතු යැයි සසප කියා සිටී. කොලඹ ආන්ඩුවේ යුද්ධයට මෙන් ම එල්ටීටීඊයට ද විරුද්ධ වී ඇති හා වැඩ කරන ජනතාවගේ අයිතීන් ආරක්ෂා කර ඇති දිගු කාලීන සසප සාමාජිකයකු ලෙස විමලේස්වරන් ප්‍රදේශය පුරා ප්‍රසිද්ධ ය. ආරක්ෂක අමාත්‍යංශය මෙම දෙදෙනා සොයා ගැනීමට වහාම පූර්න පරීක්ෂනයක් පැවැත්විය යුතු යැයි ඉල්ලා සිටින ලෙස අපගේ ආධාරකරුවන් හා *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* පාඨකයන් වෙත අපි යලි කියා සිටිමු.

ලිපි යැවිය යුත්තේ:

ගෝඨාභය රාජපක්ෂ,<br>
ආරක්ෂක ලේකම්,<br>
15/5, බාලදක්ෂ මාවත,<br>
කොලඹ 3, ශ්‍රී ලංකාව.<br>
ෆැක්ස්: 0094-11-2541529.

එන්.ජී. පුංචිහේවා,<br>
අධ්‍යක්ෂ-පැමිනිලි හා පරීක්ෂන,<br>
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂම,<br>
අංක 36, කින්සි පාර,<br>
කොලඹ 8, ශ්‍රී ලංකාව,<br>
ෆැක්ස්: 0094-11-2694924.

ලිපිවල පිටපත් ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය සහ *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* වෙත එවිය යුතු ය.

සමාජවාදී සමානතා පක්ෂය,<br>
තැ.පෙ. 1270, කොලඹ. ශ්‍රී ලංකාව,<br>
ඊ-මේල්: wswscmb@sltnet.lk

මේ වන තෙක් ලැබී ඇති ලිපිවලින් කොටසක් පහත පල වේ.

* * *

ප්‍රිය මහත්මයානනි,

කයිට්ස්හි නිවැසියන් වන සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජික නඩරාජා විමලේස්වරන් හා ඔහුගේ මිතුරු සිවනාදන් මදිවදනන් මාර්තු 22 දා හැන්දෑවේ සිට අතුරුදහන්ව ඇත. මේ සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂනයක් පවත්වා ඔවුන් ආරක්ෂිතව නිදහස් කිරීමට ක්‍රියා කරන ලෙස මම ඔබගෙන් ඉල්ලා සිටිමි.

විමලේස්වරන් සසප සාමාජිකයකු ලෙස ඔහුගේ සමාජවාදී අදහස් සම්බන්ධයෙන් කයිට්ස් දූපත තුල ප්‍රසිද්ධ ය.

විමලේස්වරන් හා මදිවදනන් අතුරුදහන් වූයේ කයිට්ස් දූපතේ වේලෙනෙයිහි දී හෝ පුංගුඩුතිව් දූපතේ දී ය. මාර්තු 22 දා, ඔහුගේ ඇඳුම් කිහිපයක් රැගෙන එනු පිනිස විමලේස්වරන් සිය මිතුරාගේ යතුරු පැදියේ නැගී පුංගුඩුතිව්හි මදතුවේලි ගමේ ඔහු කුලියට ගත් නිවසට ගොස් තිබුනි. ඔවුහු ගල් පාලම හරහා මදතුවේලි ගම්මානයට ඇතුලු වී එයින් පිටවූ නමුදු සිය නිවෙස් කරා පැමිනියේ නැත.

අතුරුදහන් වීම්, පැහැර ගැනීම් හා ඝාතන නිරන්තරයෙන් සිදු වන යුද්ධයක සන්දර්භය තුල විමලේස්වරන්ගේ හා මදිවදනන්ගේ ආරක්ෂාව ගැන මම බෙහෙවින් උත්සුක වෙමි. මෙම ප්‍රදේශය නාවික හමුදාවේ පාලනය යටතේ පවතින බැවින් මෙම සිද්ධියට නාවික හමුදාව සම්බන්ධ බවට සැකයක් මතු වේ. නාවික හමුදාව සහ එය සමග සහයෝගීව ක්‍රියා කරන පැරා-මිලිටරි කන්ඩායම් විසින් මෙම ප්‍රදේශයේ සිදු කරනු ලබන මර්දන ක්‍රියාවන් පිලිබඳ වාර්තා මෙම සැකය වැඩි දියුනු කරයි.

එම්.ජී. කිරිබන්ඩා,

මහ බැංකු සේවක සංගමයේ සභාපති,

ශ්‍රී ලංකා මහ බැංකුව.

●●●

ප්‍රිය රාජපක්ෂ මහත්මයානෙනි,

නඩරාජා විමලේස්වරන් හා සිවනාදන් මදිවදනන් අතුරුදහන් වීම

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ සාමාජික නඩරාජා විමලේස්වරන් හා ඔහුගේ මිතුරු සිවනාදන් මදිවදනන් 2007 මාර්තු 22 දා කයිට්ස්හි දී අතුරුදහන් වීම සම්බන්ධයෙන් වහාම පරීක්ෂනයක් අරඹන ලෙස ඔබගෙන් ඉල්ලා සිටීමට අපි මෙය ලියමු. මෙම අතුරුදහන් වීම් සිදු වන්නේ, ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවන් සහ ඔවුන්ගේ පැරා-මිලිටරි සගයන් නීති විරෝධී අත් අඩංගුවට ගැනීම්, රඳවා ගැනීම්, පැහැර ගැනීම් හා නීතියට පරිබාහිරව කෙරෙන ඝාතන ආදියෙන් සමන්විත, විශේෂයෙන් ම පීඩිත දෙමල තරුනයන්ට, ගොවියන්ට, ධීවරයන්ට හා කම්කරුවන්ට එරෙහිව, මෘග මර්දන ව්‍යාපාරයක් ගෙන යමින් සිටින අවස්ථාවක ය. මේ සම්බන්ධයෙන් ඔබගේ ආන්ඩුවේ වාර්තාව ජාත්‍යන්තරව ප්‍රසිද්ධ ය.

සමාජවාදී සමානතා පක්ෂයේ සහ හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ හා එහි ප්‍රකාශනය වන *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* සාමාජිකයකු ලෙස ඔහු දරන ධෛර්‍ය සම්පන්න හා සප්‍රතිපත්තික

සමාජවාදී දේශපාලන අදහස් සම්බන්ධයෙන් විමලේස්වරන් කයිට්ස් ප්‍රදේශය තුල ප්‍රසිද්ධ අයෙකි. ශ්‍රී ලංකාවේ උතුරේ හා නැගෙනහිර දෙමල ජනයාට එරෙහිව ඔබගේ ආන්ඩුව ගෙන යන මෘග මර්දනකාරී යුද්ධයට ඔහු දක්වන දේශපාලන විරුද්ධත්වය විමලේස්වරන් ඔබ ආන්ඩුවේ සතුරකු බවට පත් කර ඇත.

උතුරේ දූපත් ප්‍රදේශ පාලනය කරන ශ්‍රී ලංකා නාවික හමුදාව මෙම අතුරුදහන් වීම්වලට සම්බන්ධිත බවට බලගතු සාක්ෂ්‍ය දැනටමත් පවතී. එබැවින් විමලේස්වරන්ගේ හා මදිවදනන්ගේ ජීවිතවල ආරක්ෂාව සම්බන්ධයෙන් අපි බැරෑරුම්ව හා යුක්ති සහගතව උත්සුක වෙමු. කයිට්ස් ප්‍රදේශය පවතින්නේ ඔබගේ ආඥාව හා අධිකාරිය යටතට වැටෙන ශ්‍රී ලංකා නාවික හමුදාවේ මිලිටරි පරිපාලනය යටතේ බව ද අපි දනිමු. එබැවින් විමලේස්වරන්ට හෝ මදිවදනන්ට කිසි යම් හානියක් සිදු වුව හොත් කයිට්ස් ප්‍රදේශයේ පදනම් සිටින ශ්‍රී ලංකා ආරක්ෂක හා පැරා-මිලිටරි හමුදාවන් සමග ඔබ ද මෙම දේශපාලනිකව මෙහෙයවුනු අපරාධය සම්බන්ධයෙන් සෘජුව ම වගකිව යුතු වනු ඇත.

මීට,

අවංක,

ඒ.ආර්, සහ එම්.එෆ්., ඕස්ට්‍රේලියාව

෧෧෧

ප්‍රිය මහත්මයානනි,

ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳ කාරනාවක් ලෙස, සසප සාමාජික නඩරාජා විමලේස්වරන් හා ඔහුගේ මිතුරු සිවනාදන් මදිවදනන් අතුරුදහන් වීම සම්බන්ධයෙන් වහාම පරීක්ෂනයක් පවත්වන ලෙස මම ඔබගෙන් ඉල්ලා සිටිමි.

ඕස්ට්‍රේලියාවේ රැකියා විරහිත කම්කරුවකු වන මම වසර බොහෝ ගනනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ සසපයේ සප්‍රතිපත්තික අරගලය අධ්‍යයනය කොට ඇත්තෙමු. පසු ගිය වසරේ අගෝස්තුවේ දී සසප ආධාරකරුවකු වූ සිවප්‍රකාශම් මරියදාස් ඝාතනයේ දී මෙන් ම ඔබගේ සන්නද්ධ හමුදාවල සාමාජිකයන් හිතා මතාම කියා පා ඇත්තේ නඩරාජා විමලේස්වරන් හා සිවනාදන් මදිවදනන් එල්ටීටීඊ සාමාජිකයන් බව යි. මේ ආකාරයේ මුලුමනින් ම බොරු ප්‍රචාර, මෙම සාපරාධී වර්ගවාදී යුද්ධයට විරුද්ධ වන ඕනෑම අයකු ප්‍රචන්ඩ ලෙස මර්දනය කිරීමේ සිය පිලිවෙත යුක්තියුක්ත කර ගනු වස් මිලිටරිය විසින් යොදා ගනු ලැබ ඇත.

මේ මිනිසුන් දැවැන්ත අන්තරායකට මුහුන දී සිටිය හැකි ය. ලෝකයා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* හරහා ඔබ දෙස බලා සිටින අතර ශ්‍රී ලංකාවේ සසප කර ඇති ඉල්ලීම්වලට ඔබ දක්වන ක්ෂනික ප්‍රතිචාරය කුමක්ද යන්න සෑම රටකම සිටින ජනයා බලා සිටිනු ඇත.

මීට,

අවංක,

එස්.පී. ඕස්ට්‍රේලියාව.

© www.wsws.org